මධ්‍යම අධිවේගී මාගර් ව්‍යාපෘතියට බාධාවක් බවට පත්ව තිබූ, ගම්පහ දාරළුව ප්‍රදේශයේ තිබූ, රතු දත්ත පොතට පවා ඇතුළත් බව කියන, මෙරටට ආවේණික ශාකයක් ලෙස හැඳින්වෙන "කෘෘඩියා සෙලනිකා" හෙවත් පඬුකරඳ ශාකය කැබිනට් තීරණයක් ඔස්සේ ජූලි 10, 2023 දින එතැනින් ගලවා ඉවත් කර තිබීම, නැවතත් මාධ්‍ය තුළ සහ සමාජ මාධ්‍ය තුළ අවධානයට ලක්ව තිබිණි.
එහිදී, මේ සම්බන්ධයෙන් වාතර්‍ා කළ ජූලි 11, 2023 රූපවාහිනී රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයන් අතුරින්, රජයේ අදහස් පමණක් වාතර්‍ා කර තිබූ මාධ්‍ය සහ, රජයේ අදහස් සමඟම පඬුකරඳ ශාකය ඉවත් කිරීමට ප්‍රතිපක්ෂ අදහස් ද වාතර්‍ා කොට තිබූ මාධ්‍ය මෙසේ වෙන් කොට දැක්විය හැක.
ඔබ සිතන ලෙසට,
1) සමාජය තුළත්, සමාජ මාධ්‍ය තුළත් ඉහළ අවධානයකට ලක්ව තිබූ, වඳවී යෑමේ තජර්නයකට මුහුණ දී ඇති බවට පැවසෙන පඬුකරඳ ශාකය ඉවත් කිරීම සම්බන්ධයෙන් වාතර්‍ා කිරීමේදී, එය ඉවත් කිරීමට කටයුතු කළ රජයේ ස්ථාවරය පමණක් වාතර්‍ා කිරීම ප්‍රමාණවත් ද?
2)පාඨකයන් හට මේ සම්බන්ධයෙන්, දැනුවත්, අපක්ෂපාතී තීරණයක් ගැනීමට නම්, එම ශාකය ඉවත් කිරීමට ප්‍රතිපක්ෂ අදහස සහ, එම ශාකය ඉවත් කළ යුතු නොවන්නේ මන්දැයි දැක්වෙන අදහස් ද ඉදිරිපත් කළ යුතු නොවේද?
3) ඒ අනුව, මේ සම්බන්ධයෙන් එක් පාශර්වයක අදහස් වලට සීමා නොවී, දෙපාශර්වයේම අදහස් පෙන්වා දෙමින්, වඩාත් සමබරව මේ සම්බන්ධයෙන් වාතර්‍ා කොට ඇති මාධ්‍ය ලෙසින් ඔබ තෝරා ගන්නේ කුමන පුවත් විකාශය(න්) ද?
(ජූලි 11, 2023 දින YouTube වෙත එක් කොට තිබූ රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් ඇසුරිණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!